

# 2014

# කාර්ය සාධන හා ගිණුම් වාර්තාව
# செயலாற்றுகை மற்றும் கணக்கு அறிக்கை
# Annual Performance & Accounts Report

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර
## மாவட்ட செயலகம் - கண்டி
## District Secretariat - Kandy

# 2014

# කාර්ය සාධන හා ගිණුම් වාර්තාව

# செயலாற்றுகை மற்றும் கணக்கு அறிக்கை

# Annual Performance & Accounts Report



## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර

## மாவட்ட செயலகம் – கண்டி

## District Secretariat - Kandy

## පෙළගැස්ම


| | පිටු අංකය |
|---|---|
| මහනුවර දිස්ත්‍රික් ලේකම්/දිසාපතිගේ පණිවිඩය | I |
| 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම | 1 |
| 1.1 දැක්ම,අගයන් හා මෙහෙවර | 2 |
| 1.2 තත්ත්ව ප්‍රතිපත්තිය | 3 |
| 1.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යන් | 4-5 |
| 2. මහනුවර දිස්ත්‍රික්කය හැඳින්වීම | 6-9 |
| 2.1 පරිපාලන සිතියම | 10 |
| 2.2 මූලික තොරතුරු | 11 |
| 3 සංවිධාන ව්‍යුහය | 12 |
| 3.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය | 13 |
| 3.2 අංශ අනුව කාර්ය මණ්ඩලය | 14-18 |
| 4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය | |
| 4.1 සාමාන්‍ය පරිපාලනය | |
| 4.1.1 ආයතන අංශ කටයුතු | 19-21 |
| 4.1.2 දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ කටයුතු | 22 |
| 4.1.3 අභ්‍යන්තර විගණන කටයුතු | 23 |
| 4.1.4 දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටු කටයුතු | 24-25 |
| 4.1.5 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කටයුතු | 26-27 |
| 4.1.6 පුහුණු හා මානව සම්පත් සංවර්ධන කටයුතු | |
| 4.1.6.1 පුහුණු වැඩසටහන | 28-29 |
| 4.1.6.2 මානව සම්පත් හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු | 30 |
| 4.1.6.3 ඵලදායිතා වැඩසටහන | 31-32 |
| 5. ව්‍යවස්ථාපිත කටයුතු හා අනෙකුත් රාජකාරි | |
| 5.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ඒකකයේ කටයුතු | 33 |
| 5.2 මෝටර් රථ ප්‍රවාහන ඒකකයේ කටයුතු | 34 |
| 5.3 පුපුරණ ද්‍රව්‍ය පාලන අංශයේ කටයුතු | 34 |
| 5.4 පාරිභෝගික සේවා අධිකාරියේ කටයුතු | 35 |
| 5.5 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා කටයුතු | 36 |
| 5.6 පරිසර කටයුතු | 37 |
| 5.7 ජන හා සංඛ්‍යා ලේඛන කටයුතු | 38 |
| 5.8 විශ්‍රාම වැටුප් කටයුතු | 39 |

6. සමාජ සේවා හා සංස්කෘතික

| | | |
|---|---|---|
| 6.1 | සංස්කෘතික කටයුතු | 40-41 |
| 6.2 | බෞද්ධ ආගමික කටයුතු | 42 |
| 6.3 | හින්දු ආගමික කටයුතු | 43 |
| 6.4 | සමාජ සේවා කටයුතු | 44 |
| 6.5 | සමාජ ආරක්‍ෂණ කටයුතු | 45 |
| 6.6 | ළමා ආරක්‍ෂක කටයුතු | 46 |
| 6.7 | මුල් ළමාවිය සංවර්ධන කටයුතු | 47 |
| 6.8 | ළමා හිමිකම් ප්‍රවර්ධන කටයුතු | 48-49 |
| 6.9 | දිස්ත්‍රික් වනිතා සංවර්ධන කටයුතු | 49-50 |
| 6.10 | ජාතික ඒකාබද්ධතා කටයුතු | 51 |
| 6.11 | කුඩා ව්‍යාපාර සංවර්ධන කටයුතු | 51 |
| 6.12 | දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන කටයුතු | 52-53 |

7. සංවර්ධන කටයුතු

| | | |
|---|---|---|
| 7.1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිකිරීම් කටයුතු | 54-57 |
| 7.2 | දිස්ත්‍රික් ආයෝජන වැඩසටහන | 58-64 |
| 7.3 | දිස්ත්‍රික් දිවිනැගුම සංවර්ධන කටයුතු | 65 |
| 7.4 | කෘෂිකර්ම කටයුතු | 66-67 |
| 7.5 | දේශීය ආර්ථික සංවර්ධනය සඳහා යහපාලනය වැඩසටහන | 67-68 |
| 7.6 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ හා සැළසුම් කටයුතු | 69 |
| 7.7 | ජලජීවි වගා ව්‍යාප්ති කටයුතු | 70 |
| 7.8 | රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් දෙපාර්තමේන්තු ගෙවීම් විස්තර | 71 |
| 7.9 | ආදායම් එක්රැස් කිරීමේ කටයුතු | 72 |

8. 2014 වාර්ෂික ගිණුම් වාර්තාව 73-82

## මහනුවර දිස්ත්‍රික් ලේකම්/දිසාපතිගේ පණිවිඩය....



ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ වැඩ සිටින කන්ද උඩරට මහනුවර, ලෝක උරුම නගරයක් ලෙස ලෝකවාසී බෞද්ධ ජනතාවගේ මහත් වූ ගෞරවාදරයට පාත්‍රව ඇත. මහනුවර දිස්ත්‍රික්කය ස්වභාව සෞන්දර්යෙන් මෙන්ම සෞම්‍ය වූ දේශගුණයකින් පොහොසත් වූ සුවිශේෂී දිස්ත්‍රික්කයකි.

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2014 වර්ෂය තුලද අභ්‍යන්තර පරිපාලන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම උදෙසා විවිධ උපාය මාර්ග ක්‍රියාත්මක කරමින්, ජනතා සිතුම් පැතුම් වලට වඩාත් සමීප දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයක් ස්ථාපිත කිරීම තුලින් පරිසර හිතකාමී තිරසාර සංවර්ධනයක් කරා යොමු විය.පෙරහැර භාරයේ කටයුතු, සංස්කෘතික, සමාජ සේවා, සමාජ ආරක්ෂණ, ආපදා කළමනාකරණ, පාරිභෝගික ආරක්ෂණ, කිරුම් මිණුම්, මැතිවරණ, පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු , දිස්ත්‍රික් සම්බන්ධීකරණ හා දිස්ත්‍රික් සංවර්ධන ආදී සියලු කමිටු කැඳවීම් හා මෙහෙයවීම් වැනි ව්‍යවස්ථාපිත හා  ව්‍යවස්ථාපිත නොවන සියලු කටයුතු පසුගිය වසර තුළදී සාර්ථකව ඉටු කරනු ලැබීය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙන්ම  ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්යාල පරිසරයන් හා භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් මහජනතාවට වඩාත් සමීපව ඔවුනට ගෞරවාන්විතව සළකන කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීමට ද  කටයුතු කරනු ලැබීය.

2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී ඉහළ කාර්ය සාධන මට්ටමක් කරා ළඟාවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටද හැකි වීම සුවිශේෂී තත්ත්වයකි.ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් 2013 වසරේ පැවති ජාතික ඵලදායිතා සම්මාන උළෙලේ දී මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අන්තර් දෙපාර්තමේන්තු අංශයෙන් දෙවැනි ස්ථානයත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතරින් ප්‍රථම ස්ථානයත් හිමි කර ගන්නා ලදී.එසේම මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 න් කාර්යාල 18ක්  තරඟය සඳහා ඉදිරිපත් වූ අතර ඒ සෑම කාර්යාලයකටම ජයග්‍රහණක් හිමි වීම සුවිශේෂී තත්ත්වයකි. දිස්ත්‍රික්  ලේකම් කාර්යාලය මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්ය මණ්ඩලය එකම කණ්ඩායමක් ලෙස කටයුතු කරමින් මෙවන් වූ ඉහළ කාර්ය සාධන මට්ටමක් දිස්ත්‍රික්කය තුළ පවත්වාගෙන යාමට නිරන්තරයෙන් ඇපකැප වී කටයුතු කිරීම ඉමහත් සතුටට කරුණකි.

ඒ අනුව දිස්ත්‍රික්කයේ සංවර්ධනාත්මක හා පරිපාලනමය කාර්යක්ෂමතාවය පිළිබිඹු වන්නා වූ 2014 වසරේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව එළිදැක්වීම සඳහා කටයුතු කරනු ලැබූ සමස්ත කාර්ය මණ්ඩලයේ සේවය ඉතා අගය කොට සළකමි.

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
මහනුවර දිස්ත්‍රික් ලේකම්/ දිසාපති

# 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම

මධ්‍යම පළාතේ ප්‍රධානතම දිස්ත්‍රික්කය වන මහනුවර දිස්ත්‍රික්කය උතුරට මාතලේ දිස්ත්‍රික්කයෙන් ද නැගෙනහිරට බදුල්ල දිස්ත්‍රික්කයෙන් ද දකුණට නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ද බස්නාහිරට කෑගල්ල දිස්ත්‍රික්කයෙන්ද මායිම්ව පිහිටා ඇත. දිස්ත්‍රික්කයට සම්පතක් වී ඇති සමනළ අඩවියේ උපන් මහවැලි නදිය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඔස්සේ ගඟඉහළ කෝරළේ, උඩපළාත, දොළුව, උඩුනුවර, යටිනුවර, හාරිස්පත්තුව, ගඟවට කෝරළේ, කුණ්ඩසාලේ හා මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා ගලා බැස පසුව දිස්ත්‍රික්ක මායිමෙන් ගලා ගොස් මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා බදුල්ල දිස්ත්‍රික්කයට වැටේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20කින් ද ප්‍රාදේශීය සභා බලප්‍රදේශ 17කින් ද ග්‍රාම නිලධාරි වසම් 1,188කින් ද සමන්විත වන මහනුවර දිස්ත්‍රික්කයේ ජනගහනය 2011 ජන හා නිවාස සංගණනය අනුව 1,369,899 ක් වේ . මුළු ජනගහනයෙන් 74.34% ක් සිංහල ද, 11.31% ක් ද්‍රවිඩ ද, 13.95% ක් මුස්ලිම් ද, 0.40% ක් වෙනත් ජාතීන්ගෙන් ද සංයුක්ත වේ. කන්ද උඩරට ජනතාව ආගන්තුක සත්කාරයට මහත් රුචිකත්වයක් දක්වන උතුම් මානුෂික ගුණාංග වලින් හෙබි සුවිශේෂී ජන පිරිසක් වන අතර ඒ බව සමාජ විද්‍යාඥයින් විසින් ද පිළිගෙන ඇත.

විටින් විට විවිධ විදේශීය ආක්‍රමණවලට ලක්වූව ද කන්ද උඩරට රාජධානිය ස්වාධීනව පැවති නමුදු වර්ෂ 1815 මාර්තු දෙවෙනි දා අත්සන් කරන ලද උඩරට ගිවිසුමත් සමඟම එහි ස්වාධීනත්වයද බිඳී යමින් සමස්ත ලක්දිවම බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් විය.එහි ප්‍රතිඵලයක් වශයෙන් කන්ද උඩරට පැවති රජු මුල් කර ගත් දේශීය රාජ්‍ය පරිපාලන ව්‍යුහය මුළුමනින්ම බිඳ වැටුණු අතර බ්‍රිතාන්‍ය අණසකට යටත් පරිපාලන රටාවක් බිහි විය. ඒ අනුව බ්‍රිතාන්‍ය යුගයේ මධ්‍යම පළාතේම ප්‍රධාන පරිපාලන නිලධාරියා මහනුවර කච්චේරියේ දිසාපතිවරයා විය. ඉතිහාසගත තොරතුරු මූලාශ්‍ර වලට අනුව මහනුවර කච්චේරිය ක්‍රි.ව. 1825 දී මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන ආරම්භ කොට ඇත. මහනුවර ප්‍රථම දිසාපතිවරයා ලෙස සුදු ජාතික ජෝර්ජ් ටර්නර් මහතා 1825 සිට 1837 දක්වා කාලය තුළ කටයුතු කොට ඇත.

මහනුවර රජගෙදර කේන්ද්‍ර කොටගෙන පවත්වාගෙන යනු ලැබූ මහනුවර කච්චේරිය 1868 දී ශ්‍රී දළදා මාළිගාවේ පත්තිරිප්පුව වෙත රැගෙන ගොස් ඇති බවටද තොරතුරු හමුවෙයි. එවකට මහනුවර සමයේ දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ පී.ඩබ්. බේබෲක් මහතාය.

පසු කාලීනව විවිධ හේතූන් මත මහනුවර කච්චේරිය මහනුවර තැපැල් කාර්යාල ගොඩනැගිල්ලට තාවකාලිකව ගෙන ගොස් ඇත. පසුව 1880 දී ශ්‍රී දළදා මාළිගාවට සමීපව ඉදිකළ ගොඩනැගිල්ලට (පසු කාලීනව උසාවි ගොඩනැගිල්ල) ගෙන ගොස් ඇති අතර එවකට දිසාපතිවරයා ලෙස කටයුතු කොට ඇත්තේ සුදු ජාතිකයෙකු වූ එෆ්.බී. ටෙම්ප්ලර් මහතාය. එවක් පටන් අවුරුදු 80 ක් පමණ රාජකාරි කටයුතු අඛණ්ඩව සිදු වී ඇත්තේ එම ස්ථානයේය.

1957 වර්ෂයේ දී මහනුවර කච්චේරිය දැනට යටිනුවර වීදියේ පවත්නා ගොඩනැගිල්ලට ගෙන ගොස් ඇති අතර එවකට දිසාපතිවරයා ලෙස කටයුතු කර ඇත්තේ ඒ.බී.එස්.එන් පුල්ලෙයාර් මහතා වේ. 1946 වර්ෂයේ සිට ලංකා සිවිල් සේවයේ නිලධාරින් දිසාපතිවරුන් වශයෙන් සේවය කර ඇත. වර්තමාන දිසාපතිවරයා වශයෙන් විවිධ රාජ්‍ය ආයතන ගණනාවක සේවා අත්දැකීම් සහිත, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වන එච්.එම්.ගාමිණී සෙනෙවිරත්න මහතා 2010 වර්ෂයේ සිට මේ දක්වා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ අංශ 25 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති අතර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා මැතිවරණ දෙපාර්තමේන්තුවද මෙම ගොඩනැගිල්ල තුළම ස්ථාපිත කර ඇත.

## 1.1 දැක්ම , අගයන් හා මෙහෙවර

### දැක්ම

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම
පරිපාලන ආයතනය බවට පත් කිරීම.

### අගයන්

- ආචාරශීලි සහ සුහදශීලි සේවය
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සැළකීම හා ගරු කිරීම
- ආබාධිත පුද්ගලයන්ට ප්‍රමුඛතාවය
- කණ්ඩායම් හැඟිමෙන් කටයුතු කිරීම
- පරිසර හිතකාමි කාර්යාල පරිසරයක්
- දැනුම කළමනාකරණ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම
- උපරිම පාරිභෝගික සත්කාරය මඟින් සේවාලාභීන් අමන්දානන්දයට පත් කිරීම

### මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව
දිස්ත්‍රික්කයට ආවේණික වූ
ප්‍රෞඪ උරුමයන් සුරකිමින්
මහනුවර දිස්ත්‍රික්කය
තිරසාර සංවර්ධනය කරා ගෙන යාම.

**1.2 තත්ත්ව ප්‍රතිපත්තිය**

# තත්ත්ව ප්‍රතිපත්තිය

**"ISO 9001; 2008 ජාත්‍යන්තර සේවා ප්‍රමිතීන් අනුව**

**අඛණ්ඩව වැඩි දියුණු වන**

**යහපාලිත කළමනාකරණ පද්ධතියක් තුළින්**

**සේවාලාභීන් වෙත**

**උපරිම පාරිභෝගික තෘප්තියක් අත්කරදීම"**

## 1.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යන්

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා එම නිලධාරින්ගේ ආයතන කටයුතු (නිලධාරින්ගේ සේවය ස්ථිර කිරීම්, කඩඉම් පරීක්ෂණ පැවැත්වීම, උසස් වීම්/සේවය දීර්ඝ කිරීම් හා නිලධාරින්ට වැටුප් ණය අත්තිකාරම් ලබා දීම් වැනි ආයතනික පහසුකම් සැලසීම)

- දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති වසම් 1,188 ක ග්‍රාම නිලධාරින්ට අදාල වු ආයතන රාජකාරි ඉටු කිරීමෙන් ඔවුන් තුළ යහපත් මානසික තෘප්තියක් ඇති කිරීම.

- ශ්‍රී දළද මාළිගාව ප්‍රමුඛ මල්වතු අස්ගිරි මහා විහාර සහ අනෙකුත් බෞද්ධ විහාරස්ථාන කටයුතු, ශ්‍රී දළදා පෙරහැර සංවිධාන කටයුතු, දිස්ත්‍රික් ශාසනාරක්‍ෂක බල මණ්ඩලයේ කටයුතු ඇතුළු බෞද්ධ ආගමික කටයුතු

- හින්දු, ඉස්ලාම්,කතෝලික හා අනෙකුත් ආගම් වලට අදාළ කටයුතු

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව, දිස්ත්‍රික් නිවාස කමිටුව, දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ කමිටුව, දිස්ත්‍රික් ආරක්‍ෂක/ආපදා කළමනාකරණ කමිටුව, යනාදී කමිටු පැවැත්වීමෙන් හා දිස්ත්‍රික් ලේකම් ප්‍රධානත්වයෙන් පැවැත්විය යුතු සියළු රැස්වීම් සංවිධානය කරමින් අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.

- ආර්ථික සංවර්ධන කටයුතු සහ ජලය, විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සමඟ දිස්ත්‍රික් ආයෝජන සැළැස්ම ක්‍රියාත්මක කිරීම.

- විවිධ රාජ්‍ය උත්සව සංවිධානය කර සාර්ථකව පැවැත්වීම.

- මැතිවරණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික්කයේ මැතිවරණ කටයුතු මෙහෙයවීම.

- නවක රාජ්‍ය නිලධාරින් පුහුණු කිරීම හා දැනට සේවයේ නිරත රාජ්‍ය නිලධාරින්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම උදෙසා කාලීන අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල යහපත් මුල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය මඟින් පරීක්ෂා කිරීම තුළින් මඟ පෙන්වීම.

- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළනැංවීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්පත් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රමසම්පාදන කටයුතු ඉටු කිරීම

- දිස්ත්‍රික් දිවිනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්‍ෂණයේ පවතින කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, පාරිභෝගික අධිකාරිය, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය, සමාජ ආරක්‍ෂණ අංශය, දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය, සංඛ්‍යා ලේඛන අංශය, මෝටර් රථ ප්‍රවාහන, සංස්කෘතික හා බෞද්ධ කටයුතු, ආපදා කළමනාකරණ කටයුතු, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් අංශය, ජාතික ජලජීවී වගා ව්‍යාප්ති අංශය, කෘෂි කර්ම සහ දිවි නැගුම යන අංශ සම්බන්ධීකරණය සහ අධීක්‍ෂණය.

- මහජනයාගෙන් ලැබෙන පැමිණිලි, පෙත්සම්, දුක් ගැනවිලි, ඉල්ලීම් යනාදිය සම්බන්ධව අදාළ අංශ වෙතින් තොරතුරු ලබා ගෙන විසඳුම් ලබාදීම හා දිස්ත්‍රික් පරිපාලනයට හා ප්‍රාදේශීය පරිපාලනයට අදාල නිලධාරින් සම්බන්ධව ලැබෙන පෙත්සම්, පැමිණිලි සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණ පැවැත්වීම තුලින් යහපත් පාලනයක් ඇති කිරීම.

- මහනුවර දිස්ත්‍රික්කය තුළ කොස්, දෙල් ගස් හෙළීම සඳහා ගස් සංඛ්‍යාව 03කට වඩා වැඩි 15කට වඩා අඩු අවස්ථාවන් වලදී බලපත්‍ර නිකුත් කිරීම අනුමත කිරීම සහ ගස් සංඛ්‍යාව 15 ට වඩා වැඩි අවස්ථාවන් වලදී කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ ලබා දීම.

- මහනුවර දිස්ත්‍රික්කය තුළ ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම, වාර්ෂිකව පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ලබා දීම හා ආරක්ෂක සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය පරිශ්‍රයේ කාර්යාල සඳහා ජල විදුලි හා අභ්‍යන්තර දුරකථන පහසුකම් සැලසීම තුලින් මහජන සේවා සැපයීමට යටිතල පහසුකම් සැලසීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අධීක්ෂණය වන කාර්යාලවල ආයතන කටයුතු ඉටු කිරීම.

- මහනුවර දිස්ත්‍රික්කයෙහි සිදු වන ස්වාභාවික සහ හදිසි ආපදාවන් වලදී පීඩාවට පත්වන ජනතාවට කඩිනම් සහන සැළසීම සඳහා අවශ්‍ය ක්ෂණික පියවර ගැනීම සහ දිර්ඝකාලීන විසඳුම් අවශ්‍ය වන අවස්ථාවන් වලදී අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය පියවර ගැනීම.

- දිස්ත්‍රික්කයෙහි කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සහ රජය විසින් ජනතාවට සහන සැළසීම උදෙසා වන කාර්යන් (උදා :- පොහොර සහනාධාරය) කඩිනමින් ඉටු කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ සිදු කිරීම.

# 2. මහනුවර දිස්ත්‍රික්කය හැඳින්වීම

මනහර කඳුවැටි හා නිම්න භූමි වලින් සැදුම්ලත් මහනුවර දිස්ත්‍රික්කය මධ්‍යම කඳුකරයේ වර්ග කිලෝමීටර් 1,940 ක භූමි ප්‍රමාණයක් වසා පැතිරී ඇති මනරම් භූමි භාගයකි.

උතුරින් මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල, රත්තොට ලග්ගල-පල්ලේගම හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් ද, නැගෙනහිරින් බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ද, දකුණින් බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ, නුවරඑළිය හා අඹගමුව කෝරළේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද, බටහිරින් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක, බුලත්කොහුපිටිය, මාවනැල්ල හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් මායිම් වී පවතින මහනුවර දිස්ත්‍රික්කය, උතුරු අක්ෂාංශ 60.56 ත් 70.29 හා නැගෙනහිර දේශාංශ 80.25 ත් 80.0 අතර පිහිටා ඇත.

මහනුවර දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රදේශයක් ස්පර්ශ කරමින් ගලා යන මහවැලි ගංගාව දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ වලින් ගලා එන ජල ධාරාවන්ගෙන් පෝෂණය වේ. මීට අමතරව දැදුරු ඔයේ ආරම්භක ජල ධාරා පෝෂණය වන්නේ ද පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙනි. දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල බටහිර බෑවුමෙන් ගලා යන ජලධාරා මා ඔයට එක් වී එහි ධාරිතාවය වැඩි කරයි.

මධ්‍යම පළාතේ දිස්ත්‍රික්කයන් වන මහනුවර,මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්ක තුනෙන් ප්‍රධාන වූ මහනුවර දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20කින් ද ප්‍රාදේශීය සභා බලප්‍රදේශ 17කින් ද ග්‍රාම නිලධාරි වසම් 1,188කින් ද සමන්විත වන්නේය. 2011 ජන හා නිවාස සංගණනය අනුව මහනුවර දිස්ත්‍රික්යේ ජනගහනය 1,369,899ක් වේ. එයින් 74.34% ක් සිංහල ද, 11.31%ක් ද්‍රවිඩ ද, 13.95%ක් මුස්ලිම් ද, 0.40% ක් වෙනත් ජාතීන් ද වේ. සාමාන්‍යයෙන් කන්ද උඩරට ජනතාව විශේෂ සමාජයීය ගති ලක්ෂණයක් වන ආගන්තුක සත්කාරයට රුචිකත්වයක් දක්වන පිරිසක් බව සමාජ විද්‍යාඥයින්ගේ මතයකි.

**ඓතිහාසික පසුබිම**

අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන මහනුවර, අනුරාධපුර, පොළොන්නරු යුගයන් වලදී මලය රට ප්‍රදේශයට අයත්ව තිබූ අතර ගම්පොළ රජ කළ තුන්වන වික්‍රමබාහු රජ දවස නගරයක් වශයෙන් දියුණු කළ බව ජනප්‍රවාදයේ දැක්වේ. සෙංකඩගල නුවර නමින් එදා හැඳින් වූ මහනුවර පළමු වන විමලධර්මසූරිය රජතුමා විසින් සිංහල රාජධානියේ අග නගරය ලෙස යොදා ගනිමින් අලංකාර දළදා මන්දිරයක්, රජ මාළිගයක් ඇතුළු සියලුම අංග වලින් සම්පූර්ණ නගරයක් බවට පත් කරන ලදි. එතැන් සිට සියවස් තුනක පමණ කාලයක් පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන බටහිර බලවත් ජාතීන්ගේ නිර්මල බුදු දහම හා සිංහල සංස්කෘතිය ආරක්ෂාකර ගනිමින් 1815 මාර්තු 02 වන දින දක්වා සිංහල රාජධානියේ අගනුවර වශයෙන් සෙංකඩගල පුරවරය නොසැලී පැවතුනි. මුහුදු බඩ පළාත් බටහිර ජාතීන් පාලනය කළ යුගයේ දී ඔවුන් විසින් මහනුවර රාජධානියට වරින් වර එල්ල කෙරුන ආක්‍රමණයන්ට එරෙහිව සිදු වූ ජයග්‍රාහී සටන් බොහෝමයක් මහනුවර ආශ්‍රිතව සිදු විය. දෙවන රාජසිංහ රජ සමයේ පේරාදෙණිය, ගන්නෝරුවේ දී සහ යටිනුවර දන්තුරේ දී සිදු වූ සටන් වලින් ආක්‍රමණික විදේශ හමුදා සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය. විදේශිකයන්ගෙන් සිංහල රාජධානිය රැක ගැනීමට පිහිට වූ ප්‍රධාන බල කොටුවක් වන බලන කොටුව වර්තමාන කඩුගන්නාව නගරය ආසන්නයේ පිහිටා ඇත.

1815 දී විවිධ දේශපාලන අර්බුද නිසා මහනුවර රාජධානිය බ්‍රිතාන්‍ය ජාතිකයන්ට අයත් වූ පසු අවසන් සිංහල රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එම වසරේ පෙබරවාරි 15 වන දින මැදමහනුවර බෝමුරේ ගම්මානයේ දී ඉංග්‍රීසීන් විසින් අල්ලා ගන්නා ලදි. 1815 මාර්තු මස 02 වන දින මහනුවර මඟුල් මඩුවේ දී අත්සන් තැබුණු උඩරට ගිවිසුම මඟින් ශ්‍රී ලංකාවේ පාලනය ඉංග්‍රීසීන් අතට පත් වූ අතර ඔවුන් විසින් රටේ අග නගරය ලෙස කොළඹ භාවිතා කරන තෙක්ම රටේ ප්‍රධාන නගරය ලෙස සැලකුනේ මහනුවරයි.

සිංහල ඉතිහාසයේ අවසන් නිදහස් සටන වන 1818 දී ඌව - වෙල්ලස්ස කැරැල්ල වෙනුවෙන් මහනුවර ප්‍රදේශයේ රදළ නායකයින් විශාල පිරිසක් නායකත්වය දී ඇත. සිය තනතුරු පසෙකලා නිදහස් සටන වෙනුවෙන් කැපවුනු මොණරවිල කැප්පෙටිපොළ, මඩුගල්ල ආදී නායකයන් බොහෝ දෙනෙකුගේ නිජ බිම වී ඇත්තේ මහනුවර ප්‍රදේශයයි. 1818 නිදහස් අරගලය කෲර ලෙස මැඩපැවැත් වූ ඉංග්‍රීසීන් විසින් මහනුවර ප්‍රදේශය ඇතුළු කඳුකරය වැවිලි කර්මාන්තය හා වෙළදාම මත පදනම් වූ ආර්ථික රටාවක් කරා ගෙන යන ලදි.

වැවිලි ආර්ථිකය යටතේ මුලින්ම හඳුන්වා දුන් කෝපි වගාව දිලීර රෝගයක් නිසා විනාශ වූ පසු දිවයිනේ සිටුවන ලද පළමු තේ ගස දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලූල්කඳුර වතු යායේ අදත් දක්නට ඇත.

**ඓතිහාසික ස්ථාන**

මුළු මහත් ලෝකයේම බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වූ ශ්‍රී දළදා මාළිගාව මහනුවර නගරයේ පිහිටා ඇති අතර ඓතිහාසික වශයෙන් වැදගත් වූ සිද්ධස්ථාන විශාල ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

1. ගඩලාදෙණිය විහාරය
2. ඇම්බැක්ක දේවාලය
3. දෙගල්දොරුව රජමහා විහාරය
4. ගල්මඩුව රජමහා විහාරය
5. තලාව රජ මහා විහාරය

**දේශගුණික හා පාරිසරික ලක්‍ෂණ**

මධ්‍යම කඳුකරය ප්‍රධාන වශයෙන් මුහුදු මට්ටමේ සිට මීටර් 100 -1,600 ත් අතර උසකින් යුක්තව පිහිටා ඇත. එසේ වුවද මහනුවර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය, මහවැලි ගඟට මායිම්ව මුහුදු මට්ටමේ සිට මීටර් 100 ක පමණ උසින් යුතුව තැනිතලා ස්වභාවයක් ගනී. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1,840 අගයක් ගන්නා අතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර ප්‍රදේශය වන මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කඳුකර හා පහත රට වියළි කලාපීය දේශගුණික ලක්‍ෂණයන් සහිතය. සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 20-22 අතර අගයක් ගන්නා අතර වසර පුරාම සෞම්‍ය දේශගුණයක් දිස්ත්‍රික්කයේ වැඩි භූමි ප්‍රදේශයක පවතී. සාමාන්‍යයෙන් දෙල්තොට, පස්බාගේ කෝරළේ, ගඟ ඉහළ කෝරළේ, උඩදුම්බර, පන්විල ආදී ප්‍රදේශ උෂ්ණත්වයෙන් සාපේක්‍ෂව අඩු අගයක් ගන්නා අතර ප්‍රධාන වශයෙන් වියළි කලාපයේ පිහිටා ඇති මිණිපේ ප්‍රදේශය සාපේක්‍ෂව වැඩි උෂ්ණත්වයකින් යුක්තය.

මහවැලි ගංභාව දිස්ත්‍රික්කය මැදින් ගලා යන ප්‍රධාන ගංගාව වන අතර එය මුළු දුරෙන් ආසන්න වශයෙන් කි.මී. 110 ක දුරක් මහනුවර දිස්ත්‍රික්කය ආශ්‍රිතව ගලා බසී. මහවැලි ගංගාවේ ආරම්භක ජල ධාරා වන හැටන් ඔය සහ කොත්මලේ ඔය එක් වී මහවැලි ගංභාව නමින් ගලා බැසීම පටන් ගන්නේ ද පස්බාගේ කෝරළේ පොල් වතුර නම් ග්‍රාමයේ දී ය. එමෙන්ම මහවැලි කලාපයේ ප්‍රධාන කඳු ශිඛරය වන කොබෝනීල ගල, (උස මීටර් 1,553.87), දෝතළුගල (උස මීටර් 1,642.57) ආදී කඳු වැටි මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත.

සාමාන්‍ය වර්ෂාපතනය ඉහළ අගයක් ගන්නා මෙම කලාපය මහවැලි ගඟේ සහ අඹන් ගඟේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශයක් වේ. ශ්‍රී ලංකාවට ආවේණික ශාක සහ සත්ත්ව ප්‍රජාවට රැකවරණය සලසන නකල්ස් කඳුවැටිය දිස්ත්‍රික්කයේ ස්වභාව සෞන්දර්යය අතින් ඉහළම තැනක් ගන්නා ප්‍රදේශයකි.

හන්තාන කඳු වැටිය, අම්බුළුවාව කන්ද, බලන කඳුවැටිය, අලගල්ල කන්ද වැනි කඳු ප්‍රදේශ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර කඩියන්ලෙන, ගලබොඩ ආදී සුන්දර දිය ඇළි විශාල ප්‍රමාණයක් ද මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මේ දිය ඇළි වලින් විශාල ප්‍රමාණයක් අප්‍රකටව පවතින මුත් සුන්දරත්වය අතින් ඉහළ අගයක් ගනී.

**ස්වභාවික වෘක්ෂලතා**

මහනුවර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 41,521 ක් වනාන්තර වශයෙන් පවතී. මෙම භූමි ප්‍රමාණය දිස්ත්‍රික්කයේ මුළු මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 21 කි. දැඩි රක්ෂිතයන් ලෙස රැක ගත යුතු මෙම වනාන්තර වලින් හෙක්ටයාර් 23,317 භූමි ප්‍රමාණයක් ඝණ වනාන්තර වශයෙන් ද හෙක්ටයාර් 10,759 ක් විවෘත වනාන්තර සහ හෙක්ටයාර් 7,445 ක ප්‍රමාණයක් වන වගා ලෙස ද පවතී. උස් කඳු මුඳුන් ආශ්‍රිතව ද වැඩි වන ගහනයක් දක්නට ඇත. මේ හේතුවෙන් ප්‍රදේශයේ ජල උල්පත් වල පැවැත්ම සඳහා මෙම වනාන්තර ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම දැඩි අවශ්‍යතාවක් වන අතර විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙහි පැවැත්මට තර්ජන එල්ලවන අවස්ථා ඇත.

නකල්ස් රක්ෂිතයට අයත් වන ප්‍රදේශයෙන් විශාල භූමි ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයට අයත් වේ. ශ්‍රී ලංකාවට ආවේණික ශාක හා සත්ත්ව වර්ග කීපයකට වාස භූමිය වන මෙම කලාපය දැඩි ස්වභාවික රක්ෂිතයක් ලෙස නම් කර ඇත. හන්තාන කඳුවැටිය,වාකරවත්ත කැලේ මහනුවර නගරාසන්නයේ පිහිටා ඇති අතර මීන් උඩවත්ත කැලේ මහනුවර නගර සීමාව තුළ පිහිටා ඇත.හන්තාන කඳුවැටිය දැඩි පාරිසරික තර්ජනයකට ලක් වූ ප්‍රදේශයකි.

**වන සතුන්**

මහනුවර දිස්ත්‍රික්කයේ වනාන්තර ආශ්‍රිතව විශාල වන සත්ත්ව ප්‍රජාවක් ජීවත් වන අතර අලියා, දිවියා, වඳුරා, වල් ඌරා, කොළ දිවියා, මුවා, වැලි මුවා ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

උඩදුම්බර , මිණිපේ යන ප්‍රදේශවල වල් අලින් දක්නට ඇති අතර රන්දෙණිගල අභය භූමිය හා උඩදුම්බර මීමුරේ ප්‍රදේශ ආශ්‍රිතව නිරන්තරයෙන් වල් අලි සැරිසරති. මෙම ප්‍රදේශවල විශාල ලෙස පැතිරුණු වන ගහණය තුල දිවියන් ද ජීවත් වන අතර ගම්පොළ, හන්තාන, පාතහේවාහැට යන ප්‍රදේශවලින් ද දිවියන් පිළිබඳව විටින් විට වාර්තා වේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම කැලෑ ආශ්‍රිතව වඳුරන්, රිලවුන් සහ වල් ඌරන් ජීවත් වන අතර රන්දෙණිගල අභය භූමිය ආශ්‍රිතව තිත් මුවන්, ගෝණුන් සහ වැලි මුවන් වැනි සත්ත්ව විශේෂ දක්නට ඇත. මීට අමතරව පක්ෂි විශේෂයන් ද සැළකිය යුතු ප්‍රමාණයක් ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වේ.

**වන සතුන්ගෙන් ඇති වන ගැටළු**

දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල කෘෂිකාර්මික ක්ෂේත්‍රයට හා ජන ජීවිතයට වන සතුන්ගෙන් එල්ල වන බලපෑම් ඉහළ මට්ටමක පවතී. උඩදුම්බර, මිණිපේ සහ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඇතැම් ප්‍රදේශයන්හි ගම් වදින වල් අලි නිසා කෘෂිකාර්මික කටයුතු වලට මෙන්ම මිනිස් ජීවිත වලටද තර්ජනයක් එල්ල වන අවස්ථා පවති.

උඩදුම්බර ප්‍රදේශයේ මීමුරේ හා කොට්ඨාශයේ දකුණින් පිහිටි දේවහන්දිය, මඩුගල්ල හා මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹගහපැලැස්ස, හඳගනාව, උඩගලදෙබොක්ක, ගලමුදුන ආදී ප්‍රදේශ වලට මෙම ගැටළුව දැඩි ලෙස බලපායි.

රිලවුන් සහ වල් ඌරන්ගෙන් වගාවට සිදුවන හානි දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම පාහේ දක්නට ඇති අතර මෙය පාලනය කිරීමට අපහසු ගැටළුවක් බවට පත් වෙමින් තිබේ.

**ජීවන රටාව**

2011 ජන හා නිවාස සංගණනයට අනුව මහනුවර දිස්ත්‍රික්කයේ මුළු ජනගහණය 1,369,899 ක් වන අතර නාගරික, ග්‍රාමීය, වතු යන අංශ තුනම නියෝජනය කරන ජනගහණ රටාවක් පවතී. දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 12% ක් පමණ නාගරික අංශය ද, 80% ක් ග්‍රාමීය අංශය ද සහ 8% ක් පමණ ප්‍රතිශතයක් වතු අංශය ද නියෝජනය කෙරේ.

සමස්තයක් වශයෙන් ගත් කළ මහනුවර දිස්ත්‍රික්කය තුල කෘෂිකාර්මික ආර්ථික රටාවක් දැකිය හැකි අතර දිස්ත්‍රික්කයට අයත් මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 194,000 කි. ඉඩම් පරිහරණ රටාව දෙස බලන විට අස්වද්දන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය දිස්ත්‍රික්කයේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 8.5% ක් පමණ වේ. එසේම තේ, රබර්, පොල්, කුරුඳු,ගම්මිරිස්,කෝපි හා කරාබු යන වගාවන් පිළිවෙලින් 11.9%, 0.65%, 24.6%, 0.06%, 3.7%,1.2%, ක් හා 1.7% ක් වශයෙන් පවතී.

12% ක් පමණ වන නාගරික ප්‍රදේශ වල අධික ජන ඝනත්වයක් දක්නට ලැබෙන අතර ඔවුන් කර්මාන්ත හා සේවා ක්ෂේත්‍ර යටතේ තම ජීවන වෘත්තීන් වල නිරත වීමක් දක්නට ලැබේ. ඒ අනුව මෙම ක්ෂේත්‍රයන් ඔස්සේ නාගරික ජනතාව දිස්ත්‍රික්කයේ ආර්ථිකයට දක්වන දායකත්වය සුවිශේෂී වේ.

**වාරිමාර්ග පද්ධතිය**

මහනුවර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පද්ධතිය දෙස බැලීමේදී මිණිපේ ව්‍යාපාරය, මුරපොළ ඇළ ව්‍යාපාරය, ගම්පොළවෙල ව්‍යාපාරය, උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරය ප්‍රධානතම වාරිමාර්ග පද්ධති ලෙස හඳුන්වා දිය හැක.

මහනුවර දිස්ත්‍රික්කයට අයත් එකම ගොවි ජනපදය වශයෙන් මිණිපේ ව්‍යාපාරය හැඳින්විය හැක.මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත්ව පවතින මෙම ව්‍යාපාරයේ ජල මූලාශ්‍රය වන්නේ මහවැලි ගඟය. මෙහි ප්‍රධාන ඇළ මාර්ගය මිණිපේ වම් ඉවුර වන අතර එහි දිග ප්‍රමාණය කි.මී.74 කි.එසේම බෙදුම් ඇළවල් 1,556 කින් හා කෙත් ඇළවල් 491 කින් සමන්විත මිණිපේ ව්‍යාපාරයේ මුළු වගා වපසරිය අක්කර 18,595ක් වේ. වගා ප්‍රභේදයන් ලෙස වී හා අතිරේක බෝග වගාව හඳුන්වා දිය හැකි අතර වගා ප්‍රභේදයෙන් 80%ක් වී වගාව වන අතර ඉතිරි 20% අතිරේක බෝග වගාව වේ.

මුරපොළ ඇළ ව්‍යාපාරය මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට හා පාතහේවැහැට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 02 ට අයත්ව පවතින අතර ප්‍රධාන ඇළේ දිග කි.මී.15.5 කි. මෙහි වගා වපසරිය අක්කර 1,200 ක් වන අතර, වී හා අතිරේක බෝග වගා ප්‍රභේද ලෙස පෙන්වා දිය හැක.මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 2,600 කි.

පාතදුම්බර, පන්විල හා කුණ්ඩසාලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පවතින උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරයේ ජල මූලාශ්‍රය රවන් ඔය වන අතර ප්‍රධාන ඇළේ දිග කි.මී.7.1 කි. මෙහි වගා වපසරිය අක්කර 405 ක් වන අතර වී හා එළවළු බෝග ප්‍රධාන වේ. උඩුගොඩ බණ්ඩාර ඇළ ව්‍යාපාරය මඟින් පවුල් 1,000 ක් ප්‍රතිලාභ ලබයි.

උලපනේ ඔය ජල මූලාශ්‍රය කොටගත් ගම්පොළවෙල රජ ඇළ ව්‍යාපාරය ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇත. මෙහි ප්‍රධාන ඇළේ දිග කි.මී.12.8 ක් වන අතර වගා කරන බිම් ප්‍රමාණය අක්කර 405 කි. මෙමඟින් ප්‍රතිලාභ ලබන පවුල් ප්‍රමාණය 1,000 කි.

## 2. 1 පරිපාලන සිතියම - මහනුවර දිස්ත්‍රික්කය




මූලාශ්‍රය: දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් කාර්යාලය - මහනුවර

## 2.2 මහනුවර දිස්ත්‍රික්කයේ මූලික තොරතුරු



# මූලික තොරතුරු



| | |
|---|---|
| පළාත | මධ්‍යම |
| දිස්ත්‍රික්කය | මහනුවර |
| වර්ග ප්‍රමාණය (ව.කි.මී.) | 1,940 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 20 |
| ග්‍රාම නිලධාරි කොට්ඨාශ | 1,188 |
| ගම් සංඛ්‍යාව | 2,588 |
| ඡන්ද ප්‍රදේශ සංඛ්‍යාව | 13 |
| මහ නගර සභා සංඛ්‍යාව | 01 |
| නගර සභා සංඛ්‍යාව | 04 |
| ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | 17 |
| අධ්‍යාපන කලාප සංඛ්‍යාව | 06 |
| පාසැල් සංඛ්‍යාව | 649 |
| ගුරුවරු සංඛ්‍යාව | 16,280 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 271,688 |
| රෝහල් (මහ/ශික්ෂණ/දිස්ත්‍රික්/ග්‍රාමීය) සංඛ්‍යාව | 53 |
| සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව | 28 |
| වෛද්‍යවරු සංඛ්‍යාව | 1,074 |
| ඡන්ද දායකයින් සංඛ්‍යාව (2014 ඡන්දහිමි නාම ලේඛනය අනුව) | 1,049,160 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | 12 |
| පළාත් සභා මන්ත්‍රීවරු සංඛ්‍යාව (මහනුවර දිස්ත්‍රික්කය) | 29 |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සංචාරක නිල නිවාස සංඛ්‍යාව | 01 |
| මුළු ජනගහනය (2011 ජන හා නිවාස සංගණනය අනුව) | 1,369,899 |
| ස්ත්‍රී | 720,109 |
| පුරුෂ | 649,790 |
| පවුල් සංඛ්‍යාව | 344,681 |
| නිවාස ඒකක සංඛ්‍යාව | 342,255 |

මූලය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය ,මහනුවර

මැතිවරණ කාර්යාලය - මහනුවර දිස්ත්‍රික්කය,වෛද්‍ය දත්ත ඒකකය

# 3. සංවිධාන ව්‍යුහය


මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - සංවිධාන ව්‍යුහය
දිස්ත්‍රික් ලේකම් /දිසාපති හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්

## 3.1 අනුමත කාර්ය මණ්ඩලය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර

| තනතුරු නාමය | කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව අනුමත කාර්ය මණ්ඩලය | සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| **A කාණ්ඩය** | | | |
| දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී ලං.ප.සේ) | 01 | 01 | |
| **B කාණ්ඩය** | | | |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී ලං.ප.සේ) | 01 | 01 | |
| අතිරේක දිස්ත්‍රික් ලේකම්- ඉඩම් (ශ්‍රී ලං.ප.සේ) | 01 | 01 | |
| සහකාර දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී ලං.ප.සේ) | 01 | 01 | |
| ප්‍රධාන ගණකාධිකාරී ( ශ්‍රී ලං.ග.සේ) | 01 | 01 | |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක ( ශ්‍රී ලං.ග.සේ) | 01 | 01 | |
| ගණකාධිකාරී ( ශ්‍රී. ලං.ග.සේ) | 01 | 01 | |
| දිස්ත්‍රික් ඉංජිනේරු (ශ්‍රී ලං.ඉ.සේ) | 01 | 01 | |
| පරිපාලන නිලධාරි | 01 | 01 | |
| **C කාණ්ඩය** | | | |
| භාෂා පරිවර්තක | 02 | 02 | |
| සංවර්ධන සම්බන්ධීකාරක | 02 | 02 | |
| අයවැය සහකාර | 02 | 02 | |
| තාක්ෂණ සේවා නිලධාරි (සිවිල් ) | 01 | 01 | |
| තාක්ෂණ සේවා නිලධාරි (සැළසුම්) | 01 | 01 | |
| සංවර්ධන නිලධාරි | 21 | 21 | |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 24 | 23 | 01 |
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 02 | 02 | |
| පිළිගැනීමේ නිලධාරි | 01 | 01 | |
| **D කාණ්ඩය** | | | |
| රියදුරු | 06 | 06 | |
| කාර්යාල සේවක සේවය | 05 | 07 * | |
| කාර්යාල කම්කරු | 03 | 04 * | |
| සනීපාරක්ෂක කම්කරු | 02 | 02 | |
| මුරකරු | 03 | - | 03 |
| උද්‍යාන කම්කරු | 01 | - | 01 |
| සංචාරක නිවාස භාරකරු | 02 | 02 | |
| එකතුව | **87** | **85** | **05** |

* කාර්යාල සේවක සේවයේ අතිරික්ත කාර්ය මණ්ඩල මගින්, එම සේවයට අදාළ මුරකරු,උද්‍යාන කම්කරු වැනි පුරප්පාඩු තනතුරු වල රාජකාරි ආවරණය කර ගනු ලැබේ.

### 3.2 අංශ අනුව කාර්ය මණ්ඩලය

| අනු අංකය | අංශය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|---|
| | | **දිසාපති /දිස්ත්‍රික් ලේකම්**<br>එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න මහතා<br>**අතිරේක දිස්ත්‍රික් ලේකම්**<br>සුනන්ද කාරියප්පෙරුම මහතා (2014.05.31 දින දක්වා)<br>ඩබ්.ඒ.ආර්.විමලසිරි මහතා (2014.06.01 දින සිට)<br>**සහකාර දිස්ත්‍රික් ලේකම්**<br>ඒ.එච්.එම්.ඉන්දිකා කුමාරි අබේසිංහ මහත්මිය | |
| 1 | ආයතන | පරිපාලන නිලධාරි | 01 |
| | | භාෂා පරිවර්තක | 02 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 10 |
| | | සංවර්ධන නිලධාරි | 03 |
| | | ශ්‍රී.ලං.තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 |
| | | වැව්ලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | 02 |
| | | පිළිගැනීමේ නිලධාරි | 01 |
| | | රියදුරු | 06 |
| | | කාර්යාල කාර්ය සහායක | 05 |
| | | මුරකරු | 01 |
| | | සංචාරක බංගලා භාරකරු | 02 |
| | | සනීපාරක්ෂක කම්කරු | 02 |
| | | **පුපුරණ ද්‍රව්‍ය පාලන අංශය** | |
| | | පුපුරණ ද්‍රව්‍ය සහකාර පාලක | 01 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| | | රියදුරු | 01 |
| 2 | ගිණුම් | ප්‍රධාන ගණකාධිකාරි | 01 |
| | | ගණකාධිකාරි | 01 |
| | | අයවැය සහකාර | 02 |
| | | විශ්‍රාම වැටුප් නිලධාරි | 01 |
| | | සංවර්ධන නිලධාරි | 04 |
| | | මූල්‍ය සහකාර | 01 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 04 |
| | | ශ්‍රී.ලං.තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 02 |

| | | | |
|---|---|---|---|
| 3 | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) | 01 |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ (අයි සේවක) | 02 |
| | | සංවර්ධන නිලධාරි | 06 |
| | | සංවර්ධන සහකාර | 03 |
| | | විගණන සහකාර | 01 |
| | | සැළසුම් ක්‍රියාත්මක කිරීමේ සහකාර | 01 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 04 |
| | | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | 02 |
| | | රියදුරු | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 02 |
| 4 | සංවර්ධන | දිස්ත්‍රික් ඉංජිනේරු | 01 |
| | | කාර්මික නිලධාරි | 02 |
| | | සැළසුම් ශිල්පී | 01 |
| | | සංවර්ධන සම්බන්ධීකාරක | 02 |
| | | සංවර්ධන නිලධාරි | 06 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| | | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 02 |
| 5 | ඉඩම් | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) | 01 |
| | | දිස්ත්‍රික් පරිසර නිලධාරි | 01 |
| | | සංවර්ධන නිලධාරි | 04 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 01 |
| 6 | අභ්‍යන්තර විගණන | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| | | සංවර්ධන නිලධාරි | 05 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |

| | | | |
|---|---|---|---|
| 7 | දිස්ත්‍රික් දිවිනැගුම | අධ්‍යක්ෂ (දිවි නැගුම) | 01 |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ (දිවි නැගුම) | 01 |
| | | දිවිනැගුම කළමනාකරු | 08 |
| | | ප්‍රවර්ධන නිලධාරි | 01 |
| | | දිවිනැගුම සංවර්ධන නිලධාරි | 10 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| | | දිවිනැගුම ලිපිකරු | 02 |
| | | දිවිනැගුම කාර්යාල කාර්ය සහායක | 01 |
| | | රියදුරු | 02 |
| | | **විගණන අංශය** | |
| | | විගණන කළමනාකරු | 06 |
| | | අභ්‍යන්තර විගණන නිලධාරි | 07 |
| 8 | ආපදා කළමනාකරණ | දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ | 01 |
| | | දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර | 04 |
| | | සංවර්ධන සහකාර - ආපදා සහන සේවා | 01 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| | | රියදුරු | 01 |
| 9 | සංඛ්‍යා ලේඛන | දිස්ත්‍රික් සංඛ්‍යාලේඛනඥ | 01 |
| | | සංඛ්‍යා ලේඛන නිලධාරි | 04 |
| | | ශ්‍රී.ලං.තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 03 |
| | | දත්ත සටහන් ක්‍රියාකරු/ කේත ලිපිකරු | 02 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| | | රියදුරු | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 01 |
| 10 | සමාජ සේවා | මූලස්ථාන සමාජ සේවා නිලධාරි | 01 |
| | | උපදේශන නිලධාරි (සමාජ සේවා) | 01 |
| | | සංවර්ධන නිලධාරි | 01 |
| 11 | කෘෂිකර්ම | කෘෂිකර්ම අධ්‍යක්ෂ | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ (පොහොර ලේකම්) | 01 |
| | | කෘෂි සංවර්ධන සහකාර | 01 |
| | | සංවර්ධන නිලධාරි | 05 |
| | | රියදුරු | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 01 |

| | | | |
|---|---|---|---|
| 12 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරි | 01 |
| | | සහකාර ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරි | 04 |
| | | ඉඩම් පරිහරණ සැළසුම් සහකාර | 03 |
| | | සැළසුම් ශිල්පී | 02 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| | | රියදුරු | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 02 |
| 13 | මාධ්‍ය | දිස්ත්‍රික් ප්‍රවෘත්ති නිලධාරි | 01 |
| | | මාධ්‍ය විමර්ශන නිලධාරි | 01 |
| | | ව්‍යාපෘති සහකාර | 01 |
| 14 | මෝටර් රථ | මෝටර් රථ පරීක්ෂක | 05 |
| | | සංවර්ධන හා විමර්ශන නිලධාරි | 02 |
| | | විමර්ශන සහකාර | 03 |
| | | සංවර්ධන සහකාර | 06 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 05 |
| | | කාර්යාල කාර්ය සහායක | 01 |
| 15 | කුඩා ව්‍යාපාර | සහකාර අධ්‍යක්ෂ (අධි සේවක) | 02 |
| | | ව්‍යවසායකත්ව සංවර්ධන හා පුහුණු කිරීමේ නිලධාරි | 05 |
| | | වැඩසටහන් සහකාර | 01 |
| | | සංවර්ධන නිලධාරි | 01 |
| 16 | ඵලදායිතා | ඵලදායිතා සංවර්ධන සහකාර | 02 |
| | | සංවර්ධන නිලධාරි | 02 |
| 17 | සංස්කෘතික හා බෞද්ධ කටයුතු | සංස්කෘතික නිලධාරි | 01 |
| | | සංස්කෘතික සංවර්ධන සහකාර | 01 |
| | | බෞද්ධ කටයුතු සමායෝජක | 01 |
| | | සංවර්ධන නිලධාරි (බෞද්ධ කටයුතු) | 01 |
| | | සංවර්ධන නිලධාරි (හින්දු සංස්කෘතික) | 02 |
| | | ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර | 01 |
| 18 | මානව සම්පත් | වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරි | 01 |
| | | මානව සම්පත් සංවර්ධන සහකාර | 04 |
| 19 | ළමා හා කාන්තා කටයුතු | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි (දිස්ත්‍රික්) | 01 |
| | | මුල් ළමා විය සංවර්ධන නිලධාරි (දිස්ත්‍රික්) | 01 |
| | | දිස්ත්‍රික් වනිතා සංවර්ධන නිලධාරි | 01 |

| | | | |
|---|---|---|---|
| | | ජාතික ළමාරක්ෂක දිස්ත්‍රික් නිලධාරි | 01 |
| | | ජාතික ළමාරක්ෂක ප්‍රාදේශීය නිලධාරි | 01 |
| | | දිස්ත්‍රික් මනෝසමායෝජක නිලධාරි | 01 |
| 20 | පාරිභෝගික සේවා අධිකාරිය | දිස්ත්‍රික් ප්‍රධානී | 01 |
| | | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි | 01 |
| | | විමර්ශන නිලධාරි | 12 |
| | | සංවර්ධන නිලධාරි | 03 |
| | | රියදුරු | 01 |
| 21 | මිනුම් ඒකක ප්‍රමිති හා සේවා | කාර්ය භාර නිලධාරි | 01 |
| | | පරීක්ෂක නිලධාරි | 02 |
| | | සංවර්ධන නිලධාරි | 02 |
| | | සහායකවරු | 02 |
| 22 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | බලාත්මක නිලධාරි | 01 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| | | නිෂ්පාදන සහායක | 02 |
| | | කාර්යාල කාර්ය සහායක | 01 |
| 23 | දිස්ත්‍රික් ක්‍රීඩා | දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි | 01 |
| | | දිස්ත්‍රික් පුහුණුකරුවන් | 07 |
| | | සංවර්ධන නිලධාරි | 01 |
| 24 | සමාජ ආරක්ෂණ | දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි | 02 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 01 |
| 25 | ජල ජීවී වගා ව්‍යාප්ති | දිස්ත්‍රික් ජල ජීවී වගා ව්‍යාප්ති නිලධාරි | 01 |
| | | ජල ජීවී වගා ව්‍යාප්ති නිලධාරි | 02 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| | | රියදුරු | 01 |
| | | කාර්යාල කාර්ය සහායක | 01 |

# 4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධනය

## 4.1 සාමාන්‍ය පරිපාලනය

### 4.1.1 ආයතන අංශ කටයුතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමස්ත කාර්ය මණ්ඩලය හා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලයට අදාළ ආයතන කටයුතු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන වෙන් කිරීම හා නඩත්තු කටයුතු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ඉඩකඩ සහ භෞතික පහසුකම් පාලනය කිරීම, ජල විදුලි දුරකතන බිල්පත් ගෙවීම සඳහා යොමු කිරිම ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අණපනත් වලට අනුකූලව කටයුතු කළ යුතු වේ.

2014 වසරේදී  මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඒකාබද්ධ සේවයේ නිලධාරින්ගේ ආයතන කටයුතු වශයෙන් කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විශ්‍රාම ගැන්වීමේ  කටයුතු සිදු කර ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පත්කිරීම් සම්බන්ධ කටයුතු | 06 |
| 2 | සේවයේ ස්ථිර කිරිම නිර්දේශ කර යැවීම් | 26 |
| 3 | නිවාඩු සම්බන්ධ නිර්දේශ ලබාදීම | 14 |
| 4 | උසස් වීම් නිර්දේශ කර යැවීම | 71 |
| 5 | විශ්‍රාම ගැන්වීම් | 29 |

සියළුම ක්ෂේත්‍රවල නිලධාරින්ගේ කාර්ය සාධන වාර්තා යාවත්කාලීන කර පවත්වා ගැනීම ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරන අතර ඒ යටතේ පසුගිය වසර තුලදී කාර්ය සාධන ඇගයීම් වාර්තා 125ක් ගිවිසුම් ගතවීම් වාර මැද ඇගයීම /ප්‍රමාණනය කිරීම හා වර්ෂාවසානයේදී ඇගයීම/ප්‍රමාණනය කර ඇත.  මෙම නිලධාරින්ගෙන් සුදුසුකම් ලැබූ සියළුම නිලධාරින්ට අදාළව පසු ගිය වර්ෂයේ වැටුප් වර්ධක අනුමත කර ගෙවීම් කිරීමට කටයුතු කර ඇත. කාර්ය සාධන වාර්තා යාවත්කාලින කිරීම, වැටුප් වර්ධක ගෙවීම හා ඒ හා අදාළව අනෙකුත් කටයුතුවල පසුගිය වර්ෂයේ ප්‍රගතිය පහත සටහනේ දක්වා ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා අනෙකුත් මාණ්ඩලික නිලධාරින්ගේ කාර්ය සාධන වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රමාණනය කරනු ලබන අතර  වැටුප් වර්ධක ගෙවීම එම කාර්යාල මඟින් සිදු කරනු ලැබේ.

| අනු අංකය | ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කාර්ය සාධන ඇගයීම් හා ප්‍රමාණනය කිරීම් | 125 |
| 2 | වැටුප් වර්ධක නිර්දේශ කිරීම්/අනුමත කිරීම් | 85 |
| 3 | විශ්‍රාම වැටුප් ප්‍රදානයන් | 01 |
| 4 | සේවය ස්ථිර කිරීමට නිර්දේශ කිරීම | 02 |
| 5 | නව පත්වීම් අනුව අදාළ පරිශිෂ්ඨ වාර්තා යැවීම් | 21 |

ග්‍රාම නිලධාරි කටයුතු සම්බන්ධයෙන්ද සේවය ස්ථිර කිරීම්, විශ්‍රාම ගැන්වීම්, වැඩ බැලීම සඳහා ග්‍රාම නිලධාරින් පත් කිරීම, ග්‍රාම නිලධාරි පුරප්පාඩු වාර්තා කිරීම්, විදේශ නිවාඩු හා පරිපාලන ග්‍රාම නිලධාරින්ට අදාළ රාජකාරින් ආදිය වසර මුළුල්ලේම සිදු කර ඇත. 2014 වර්ෂයට අදාළව එම කටයුතු පහත සටහනේ දක්වා ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ග්‍රාම නිලධාරි සේවය ස්ථිර කිරීම් වලට අදාළ කටයුතු | 60 |
| 2 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ කටයුතු | 06 |
| 3 | විශ්‍රාම ගැන්වීම් වලට අදාළ කටයුතු | 65 |
| 4 | ස්ථාන මාරු කිරීම් සම්බන්ධ ලිපි කටයුතු | 15 |
| 5 | ග්‍රාම නිලධාරි පෙත්සම් සම්බන්ධ කටයුතු | 04 |
| 6 | විධිමත් විනය පරීක්ෂණ වලට අදාළ කටයුතු | 11 |
| 7 | ප්‍රාදේශීය ලේකම් සමුළුව වෙත ප්‍රගතිය ඉදිරිපත් කිරීම් | 12 |
| 8 | වැඩ බැලීම සඳහා ග්‍රාම නිලධාරීන් පත් කිරීම | 300 |
| 9 | ග්‍රාම නිලධාරි පුරප්පාඩු වාර්තා | 04 |
| 10 | විදේශ නිවාඩු | 15 |
| 11 | පරිපාලන ග්‍රාම නිලධාරි ස්ථාන මාරුවීම් සම්බන්ධ කටයුතු | 04 |
| 12 | පරිපාලන ග්‍රාම නිලධාරි විශ්‍රාම ගැන්වීම් වලට අදාළ කටයුතු | 03 |
| 13 | පරිපාලන ග්‍රාම නිලධාරි වැඩබැලීම් පත්වීම් | 04 |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පැවති ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා පසුගිය වසර තුළදී නවක ග්‍රාම නිලධාරීන් 328 දෙනෙකු සඳහා ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කර ඇත.

ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරන නිල නිවාස වෙන් කිරීම, නඩත්තුව හා පාලනය තවත් සුවිශේෂී කාර්යන් වේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 52 ක් තිබෙන අතර පසුගිය වසරේදී නිල නිවාස සම්බන්ධයෙන් සිදුකරන ලද කටයුතු පහත වගුවෙන් ඉදිරිපත් කර ඇත. නිල නිවාස ලබා දීම සම්බන්ධයෙන් පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන යන අතර සුදුසු නිලධාරීන්ට නිල නිවාස ලබාදීම සඳහා අතිරේක දිස්ත්‍රික් ලේකම්, ප්‍රධාන ගණකාධිකාරි හා පරිපාලන නිලධාරිගෙන් සමන්විත දිස්ත්‍රික් නිවාස කමිටුවක් මඟින් නිර්දේශ ලබා දෙනු ලබන අතර පසුගිය වර්ෂයේ නිවාස කමිටු 11ක් පවත්වා ඇත.

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රමාණය |
|---|---|---|
| 1 | වෙන් කරන ලද නිවාස සංඛ්‍යාව | 11 |
| 2 | නිල නිවාස අළුත්වැඩියා කර දෙන ලෙස කරන ලද ඉල්ලීම් | 18 |
| 3 | නිල නිවාස ඉල්ලා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර සම්බන්ධ කටයුතු | 28 |
| 4 | බැංකුගත කරන ලද නිල නිවාස කුලී චෙක්පත් ගණන | 372 |
| 5 | නිල නිවාස ඉල්ලා ඉදිරිපත් කරන ලද අභියාචනා ගණන | 10 |
| 6 | නිල නිවාස වලට අනතුරුදායක ගස් ඉවත් කිරීම් සම්බන්ධ කටයුතු | 08 |
| 7 | පවත්වන ලද නිවාස කමිටු ගණන | 11 |

ආයතන අංශය මඟින් ක්‍රියාත්මක කරන නිදහස් දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම්වලට අදාළව නිවාඩු දුම්රිය බලපත්‍ර 139 ක් හා රාජකාරි දුම්රිය බලපත්‍ර 55 ක් නිකුත් කර ඇත.දුරකථන,ජල,විදුලි බිල්පත් ගෙවීම් කිරීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා රු.5,911,254.13 ක් වැය කර ඇත.

රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා අත්තිකාරම් බී ගිණුම යටතේ දේපළ සහ ආපදා ණය ලබාදීම ආයතන අංශය මඟින් සම්බන්ධීකරණය කරනු ලබන අතර ඒ යටතේ 2014 වර්ෂය තුළ දේපළ ණය අයදුම්පත්‍ර 22 ක් රාජ්‍ය බැංකු වෙත නිර්දේශ කර යවා ඇති අතර නිලධාරීන් 52 දෙනෙකු සඳහා ආපදා ණය ලබා දී ඇත. 2015 ජනවාරි 08 දින පැවති ජනාධිපතිවරණයට අදාළ සියළු කටයුතු සම්පාදනය කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලැබීය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිල වාහන 48 ක් ලබාදී ඇති අතර මෙම වාහන කළමනාකරණය ආයතන අංශය මඟින් සිදු කරයි. 2014 වර්ෂයේදී මෙම සියලු වාහන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සර්වග්‍රාහී රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය කර ඇති අතර මේ සඳහා වැය කර ඇති මුදල රු. 2,811,956.20 කි. නිල වාහන කළමනාකරණයට අදාළව පසුගිය වසර තුළ සිදු කරන ලද කටයුතු පහත සටහනින් දක්වා ඇත.

| අනු අංකය | වාහන නඩත්තු කටයුත්ත | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන අළුත්වැඩියා කිරීම් | 18 |
| 2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන සේවා කිරීම් | 17 |
| 3 | වාහන රක්‍ෂණය කිරීම් | 48 |
| 4 | වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු සඳහා වාහන පවරා දීම | 01 |
| 5 | වාහන අනතුරු සම්බන්ධ කටයුතු අවසන් කිරීම් | 12 |
| 6 | වාහන ධාවන සටහන් පරීක්ෂා කිරීම් සහ විගණනයට ඉදිරිපත් කිරීම් (මසකට 08 බැගින්) | 96 |
| 7 | දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය වාහන අළුත්වැඩිය වාර්තා ලබා ගැනිම සහ පිරිවැය කාර්තු වාර්තා සැකසීම | 12 |

2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ක්ෂේත්‍ර නිලධාරින් හට යතුරු පැදි ලබා දීමේ වැඩසටහන මහනුවර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ මෙම වැඩසටහන යටතේ කාන්තා/පිරිමි යතුරු පැදි 9,934 ක් ක්ෂේත්‍ර නිලධාරින් හට ලබා දීමට කටයුතු කර ඇත.

**ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කිරීම හා ප්‍රාදේශීය ලේකම් සමුළු**

ප්‍රාදේශීය පරිපාලනය වඩාත් ශත්කිමත් කිරීම සඳහාත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර ඉහළ කාර්ය සාධන මට්ටමක් ඇති කිරීම සඳහාත් මසකට වරක් ප්‍රාදේශීය ලේකම් සමුළු පැවැත්වීමට කටයුතු කරනු ලැබීය.ඒ අනුව පසුගිය වසර තුළදී ප්‍රාදේශිය ලේකම් සමුළු 20 ක් පවත්වා ඇති අතර මෙය වඩාත් හොඳ ප්‍රගති පාලන ක්‍රමයක් ලෙස හඳුන්වා දිය හැක.මෙහිදී කාර්යාල මට්ටමින් හඳුනා ගන්නා ලද අඩුපාඩු පිළිබඳව සාකච්ඡාවට බඳුන් කොට ඒවා කඩිනමින් නිවැරදි කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමද, අභ්‍යන්තර විගණන අංශය මඟින් පසු විපරමකට ලක් කිරීමද සුවිශේෂි කරුණකි.

## 4.1.2 දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ කටයුතු

මහනුවර දිස්ත්‍රික්කයේ සමාජ, ආර්ථික, දේශපාලන, ආගමික හා සංස්කෘතික සංවර්ධනයට මාධ්‍ය දායකත්වය ලබාදීම තුළින් ජනතාව වෙත තොරතුරු ලබාදීම හා දැනුවත් කිරීම දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයේ ප්‍රධාන අරමුණු වේ.

**2014 වර්ෂයේ මාධ්‍ය ඒකකය මඟින් සිදු කරන ලද කාර්යන්**

01. ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම - 125
02. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු - 60
03. මාධ්‍ය ආවරණ කටයුතු - 80
04. ශ්‍රී දළදා වහන්සේ සම්බන්ධයෙන් මෙතෙක් රචනා වී ඇති විශාලතම හා විශිෂ්ටතම ග්‍රන්ථය වන "සිරිදළදා හරසරණිය" ග්‍රන්ථය මුද්‍රණය කිරීම හා බෙදා හැරීම.
05. රජයේ නිල පුවත් තොරතුරු වෙබ් අඩවියට සැපයීම.
06. දෛනිකව පුවත්පත් නිරීක්‍ෂණය කොට මහනුවර දිස්ත්‍රික්කයට අදාළ පුවත් දිසාපතිවරයා වෙත යොමු කිරීම.
07. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගැනීම.
08. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුස්තකාලයේ පොත් බැහැර දීම හා එහි සංවර්ධන කටයුතු.
09. මහනුවර දිස්ත්‍රික්කය තුළ සිදු කෙරුණු සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් මාධ්‍ය දැනුවත් කිරීම.
10. 2014 වර්ෂයේ මහනුවර දිස්ත්‍රික්කයේ පැවැති ප්‍රධාන ජාතික වැඩසටහන්, ආගමික හා සංස්කෘතික වැඩසටහන් හා සංවර්ධන වැඩසටහන් සඳහා මාධ්‍ය ආවරණය ලබාදීම.
    (සාහිත්‍ය කලා ප්‍රසාදිනී ජාතික උත්සවය,පෙරහැර සමාප්ති උත්සවය ඇතුළු විවිධ වැඩසටහන්)
11. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින්ගේ උපන්දින වෙනුවෙන් සුභ පැතුම්පත් යැවීම.
12. 2014 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශ මගින් සිදු කරන ලද විශේෂිත වැඩසටහන් ඡායාරූප ගත කිරීම හා වීඩියෝ කිරීම.
13. මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් විශිෂ්ට මහජන සේවයක් සැපයීම සඳහා කාර්යාලය තුළ සිදු කළ වෙනස්කම් සම්බන්ධයෙන් වාර්තාමය වැඩසටහනක් සකස් කිරීම.
14. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශ මගින් සිදුකරන ලද විශේෂිත වැඩසටහන් හා උත්සව වල නිවේදන කටයුතු සිදු කිරීම.
15. මහනුවර දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය ආයතනවල දුරකථන අංක ඇතුළත් දුරකථන නාමාවලියක් සකස් කිරීම.
16. මාසිකව පැවැත්වෙන ප්‍රාදේශීය ලේකම් සමුළු මාධ්‍ය ආවරණ කටයුතු .
17. මධ්‍ය පළාත් සභාවේ සැසිවාර මාධ්‍ය ආවරණ කටයුතු .
18. දිසාපතිතුමාගේ සුබ පැතුම් පණිවිඩ සකස් කිරීම.

### 4.1.3 අභ්‍යන්තර විගණන කටයුතු

අභ්‍යන්තර විගණන ඒකකය මඟින් 2014 වසර තුළ දී සිදු කරනු ලැබූ කාර්යන් පහත පරිදි වේ.

| අනු අංකය | විස්තරය | ඉලක්ක සංඛ්‍යාව | ඉටු කළ සංඛ්‍යාව | වෙනත් |
|---|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදු කිරීම | 21 | 20 | මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන කටයුතු අවසන් වී නොමැත. |
| 2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම හා පසු විපරම් කිරීම | 50 | 29 | සියළුම විගණන විමසුම් වලට පිළිතුරු සපයා ඇත |
| 3 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම, විගණන විමසුම් යැවීම හා නිරීක්ෂණ ගෙන්වා ගැනීම | 21 | 21 | - |
| 4 | දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන පැමිණිලි හා පෙත්සම් පිළිබඳව දිස්ත්‍රික් ලේකම්ගේ නියෝගය අනුව කරුණු සොයා බැලීම,විමර්ශන පවත්වා වාර්තා කිරීම | 06 | 02 | පැමිණිලි සංඛ්‍යාව අඩු වී ඇත |
| 5 | විගණන වාර්තා වලට රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමර්ශනයට අනුව අවශ්‍ය තොරතුරු ලබා ගැනීම - 2012 | 01 | 01 | - |
| 6 | ප්‍රාදේශීය ලේකම් සමුළුවල දී නිරීක්ෂණය වූ අඩු පාඩු පිළිබඳ පසු විපරම් කිරීම හා වාර්තා යැවීම | 21 | 18 | පසු විපරම් කටයුතු අවසන් කෙරෙමින් පවතී |

### 4.1.4 දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටුව

2000.03.15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ පීඑෆ්/පීඊ 7 අනුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර ඇත.

**කමිටු සංයුතිය**

සභාපති - දිස්ත්‍රික් ලේකම් / දිසාපති
සාමාජික - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි
සාමාජික - ප්‍රාදේශීය ලේකම්, ගඟවට කෝරළේ

**අනෙකුත් කමිටු සාමාජිකයන්**

අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර විගණකාධිපති
විගණන අධිකාරි

**විගණන හා කළමනාකරණ කමිටුවේ ප්‍රධාන කාර්යභාරය**

මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ අරමුණින් පහත සඳහන් කාර්යන් ප්‍රධාන වශයෙන් මෙම කමිටුවේ අවධානයට ලක් කෙරේ.

* අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්ය පථය.
